පොදු චක්‍රලේඛ අංක: 02/28/2013
දිනය: 14/02/2013

# මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ රාජකාරී ලැයිස්තුව

1. පරිපාලනමය අවශ්‍යතා

1.1 මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දිස්ත්‍රික්කයේ තාක්ෂණික කණ්ඩායමේ සාමාජිකයෙක් වන අතර ඔහු/ඇය මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත වගකිව යුතුවේ.

මාතෘ හා ළමා සෞඛ්‍ය සේවයට පහත සඳහන් සේවාවන් අයත් වේ.

- මාතෘ හා නවජන්ම සෞඛ්‍ය
- ළමා සෞඛ්‍ය (පාසැල් හා යොවුන් සෞඛ්‍ය ඇතුළුව)
- පවුල් සංවිධානය
- කාන්තා සෞඛ්‍යය

1.2 මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, තම දිස්ත්‍රික්කය තුල මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීමේ දී පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ මග පෙන්වීම අනුව කටයුතු කලයුතු වේ.

1.3 කාර්යාලය පවත්වාගෙන යාමේ උපදෙස් මාලාවට අනුව (ඇමුණුම-1) ඔහු/ඇය තම කාර්යාලය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පවත්වාගෙන යා යුතුය.

1.4 රාජකාරී වේලාවන්:
සතියේ දිනවල - පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වා
සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින - විවේක දිනයන් වේ.
අවශ්‍යතාවයකදී සතියේ දිනවල රාජකාරී වේලාවෙන් බැහැරව මෙන්ම විවේක දිනවල වුවද රාජකාරියේ යෙදීමට සූදානමින් සිටිය යුතුය.

1.5 මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මාසික ඉදිරි වැඩ සටහන අනුව රාජකාරී කලයුතු අතර, එහි පිටපත් දෙකක් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව ඊළග මාසයේ 25 දිනට ප්‍රථම අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, වෙත එවිය යුතුය.

1.6 ඔහු/ඇය දිනපොත පවත්වාගත යා යුතු අතර එය ඉදිරි මාසයේ 5 වෙනි දිනට ප්‍රථම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

2. සැලසුම් කිරීම

2.1 දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවාවන් පිළිබඳ මනා අවබෝධයක් මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත තිබිය යුතු අතර, විශේෂයෙන්ම මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීමේ වර්තමාන තත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත යුතුය.

2.2 රාජකාරියට වාර්තා කර මාස තුනක් ඇතුලත මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් දිස්ත්‍රික්කයේ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා කටයුතු සැපයීමේ වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාවක් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර, එහි පිටපතක් අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය වෙත එවිය යුතුය.

2.3 දිස්ත්‍රික්කයේ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා පිළිබඳව ප්‍රධාන ගැටළු හඳුනා ගෙන දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුවේ. එම දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය වෙත පිටපත් සහිතව දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල යුතුය.

2.4 දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් සකස් කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම කෙරෙහි අවධානය යොමුකර පවතින සම්පත් උපරිම ලෙස භාවිත කරමින් සේවා සැපයීමට ඔවුන්ට මග පෙන්විය යුතුය.

3. සම්බන්ධීකරණය

3.1 දිස්ත්‍රික්කයේ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක විය යුතු අතර, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ හා එහි විශේෂඥ කාර්යමණ්ඩලය සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගත යුතුය.

3.2 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා පිළිබඳ කටයුතු කිරීමේ දී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සෞඛ්‍ය සේවයට අදාල දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්, සෞඛ්‍ය සේවා ආයතන ප්‍රධානීන් (මධ්‍යම රජයට අයත් රෝහල් ද ඇතුලුව), හා අදාල විශේෂඥ වෛද්‍යවරුන් සමග නිරතුරුවම මනා සම්බන්ධීකරණයක් පවත්වාගත යුතුය.

3.3 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශවල හා අදාල රෝහල් වල මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා කටයුතු සැලසුම් සකස් කිරීමේ දි හා ක්‍රියාත්මක කිරීමේ දී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට හා රෝහල් ප්‍රධානීන්ට අවශ්‍ය මග පෙන්වීම කල යුතුය.

3.4 වතුකරයේ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට සහයෝගය දිය යුතුය.

3.5 මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු සඳහා අවශ්‍ය පරිදි උපදේශන කටයුතු කල යුතුය.

3.6 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සංවිධානය කිරීමේ දි හා ක්‍රියාත්මක කිරීමේ දි අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු, සංවර්ධනයට දායකවන සහකරුවන් හා රාජ්‍ය නොවන ආයතනවල නියෝජිතයන් සමග සහයෝගයෙන් ක්‍රියා කල යුතුය.

3.7 සෞඛ්‍ය සහ අධ්‍යාපන කාර්ය මණ්ඩල සඳහා, පාසැල් සෞඛ්‍ය කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ රැස්වීම්, දිස්ත්‍රික්, කලාප හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රමවත්ව පැවැත්වීම තහවුරු කල යුතුය.

4.4 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා නියාමනය සහ ඇගයීම

4.1 අධීක්ෂණය තුලින් මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩ සටහනට අදාල සියලුම සේවාවන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා නිසි මග පෙන්වීම කල යුතුය. මේ සඳහා පාලක හා තාක්ෂණ නිලධාරීන් ( දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ, ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරී, හා ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක) එක්ව කෙරෙන කණ්ඩායම් අධීක්ෂණ දිරිමත් කල යුතුය.

4.2 සෑම මසකම පහත සඳහන් ආයතන/නිලධාරීන් සම්බන්ධව අවම වශයෙන් අධීක්ෂණ හතරක් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල
- මාතෘ හා ළමා සෞඛ්‍ය, පවුල් සංවිධාන හා සුවනාරී සායන
- රෝහල් (මාතෘ වාට්ටු, සූතිකාගාර, මාතෘ හා ළමා සෞඛ්‍ය /පවුල් සංවිධාන/ සුවනාරී සායන)
- ප්‍රාදේශීය ඖෂධ ගබඩාව
- මහජන සෞඛ්‍ය පෙදි සොහොයුරියන්
- පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනින්
- පාසැල්

අනෙකුත් අධීක්ෂණ නිලධාරීන්ගේ ඉල්ලීම මත මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කාර්යාල/ක්ෂේත්‍ර අධීක්ෂණ සිදුකල හැකිය,
රෝහල්වල අධීක්ෂණ කටයුතු සිදුකිරීමේ දී ඒ පිළිබඳ ආයතනය භාර වෛද්‍ය නිලධාරී දැනුවත් කර ඔහු/ඇයගේ සහයෝගය ලබාගැනීමට කටයුතු කලයුතුවේ.

4.3 සිදුකල සියළුම අධීක්ෂණ සඳහා තම නිර්දේශ ද සහිතව අධීක්ෂණ වාර්තා සකස් කල යුතුය, එම වාර්තා සති දෙකක් ඇතුලත දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශ ද සහිතව ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුවේ. නිර්දේශ ක්‍රියාත්මක වීම පිළිබඳව පසු විපරම් කිරීම ද කල යුතුවේ.

4.4 මාතෘ හා ළමා සෞඛ්‍ය සායනික හා ක්ෂේත්‍ර සේවා නියාමනය කර අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කටයුතු කල යුතුවේ.

4.5 සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලවල පැවැත්වෙන මාසික සමුළුවලට ක්‍රමවත්ව සහභාගි වී සේවා සැපයීමට අදාලව ක්ෂේත්‍ර කාර්යාල මණ්ඩල මුහුණ පා ඇති ගැටලු පිළිබඳ සාකච්ඡා කල යුතුය. කාර්ය මණ්ඩලය වෙත නව සංකල්ප පිලිබඳ තාක්ෂණ දැනුම ලබා දී, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ පිළිබඳව දැනුවත් කළ යුතුවේ. සේවා සැපයීම සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචනය කල යුතුවේ.

4.6 මාතෘ හා ළමා සෞඛ්‍ය සම්බන්ධ සියලුම වාර්තා මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත නියමිත දිනට ලැබෙන බවට වග බලා ගත යුතුවේ. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල සහ රෝහල් වලින් එවනු ලබන වාර්තා එනම්, මාතෘ හා ළමා සෞඛ්‍ය කාර්තු වාර්තාව (H 509), පවුල් සංවිධාන මාසික වාර්තාව ( H 1200 B), උපකරණ පිලිබඳ මාසික තොග වාර්තාව ( H 1158), පවුල් සංවිධාන සම්පිණ්ඩිත වාර්තාව ( H 1159), EPI කාර්තු වාර්තාව, පාසැල් සෞඛ්‍ය කාර්තු වාර්තාව ( H 797), මාතෘ සංඛ්‍යාලේඛණ වාර්තාව ( H 830) ආදිය ඉතා හොඳින් පරීක්ෂා කර නිවැරදිභාවය තහවුරු කල යුතුවේ. වාර්තා පරීක්ෂා කිරීමේ දී හඳුනාගන්නා අඩුපාඩු නිවැරදි කර වහාම අදාල ආයතනවලට දැනුම් දීමට එම කාර්ය මණ්ඩල දැනුවත් කල යුතුවේ.

4.7 පහත සඳහන් පරිදි දිස්ත්‍රික් මට්ටමින් සමාලෝචන රැස්වීම් ක්‍රමවත්ව සැලසුම් කළ යුතුවේ.

- මාතෘ හා ළමා සෞඛ්‍ය හා ප්‍රතිශක්තිකරණ කටයුතු පිළිබඳ දිස්ත්‍රික් සමාලෝචන රැස්වීම් - පවත්නා වර්ෂය තුල කාර්තු දෙකකට වරක් එක් රැස්වීමක් බැගින් රැස්වීම් වාර දෙකක් ද, පසුගිය වර්ෂය සඳහා ජාතික මට්ටමින් එක් සමාලෝචන රැස්වීමක්,
- වාර්ෂික ජාතික හා දිස්ත්‍රික් මාතෘ මරණ සමාලෝචන රැස්වීම

- විශේෂඥ වෛද්‍ය සේවා සහිත රෝහල් සඳහා මාසිකව පරාප්ත්‍ම මරණ සමාලෝචන රැස්වීම්

විශේෂඥ මාතෘ සංරක්ෂණ සේවා සපයන සියලුම ආයතන වල ආයතන ප්‍රධානීන් හා විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහයෝගය ලබාගනිමින් පරාප්ත්‍ම මරණ සමාලෝචන රැස්වීම් සැලසුම් කිරීමටත් සම්බන්ධීකරණය කිරීමටත් කටයුතු කල යුතුය.

4.8 සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් විසින් සකස් කරනු ලබන වාර්ෂික සෞඛ්‍ය අධ්‍යාපන සැලැස්ම හොඳින් පරීක්ෂාකර එමගින් දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා සපිරෙන බව තහවුරු කල යුතුය.

4.9 මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් සෑම කාර්තුවක් අවසානයේම තම සේවා කටයුතු පිළිබඳ කාර්තු වාර්තාව (H 1160) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මගින් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත හා පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) වෙත එවිය යුතුය.

## 5. සැපයුම් කළමනාකරණය

5.1 දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හා රෝහල් වල මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා, පවුල් සංවිධාන හා සුවනාරි සායන සේවා සැපයීමට අවශ්‍ය උපකරණ හා සැපයුම් නිවැරදිව ඇස්තමේන්තු කල යුතු අතර මූල්‍ය ප්‍රතිපාදන (රාජ්‍ය හෝ වෙනත් මූල්‍ය ආධාර) උපයෝගී කරගනිමින් මධ්‍යම රජයේ අදාල ආයතන වලින් ලබාගැනීම සඳහා කටයුතු කල යුතුය.

5.2 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීමට අදාල උපකරණ හා සැපයුම් ඇස්තමේන්තු කිරීමේ දී දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට හා ආයතන ප්‍රධානීන්ට සහයෝගය ලබාදිය යුතුය.

5.3 පවුල් සංවිධාන උපකරණ, ක්ෂුද්‍ර පෝෂක, අනෙකුත් ඖෂධ හා මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීමට අදාල සැපයුම් ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයට ක්‍රමවත්ව ලබාගැනීමටත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වලට හා රෝහල් වලට එම උපකරණ අඛණ්ඩව සැපයීමටත් හැකිවන පරිදි ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුවේ.

5.4 මාතෘ හා ළමා සෞඛ්‍ය හා පවුල් සංවිධාන සේවා තොරතුරු කළමනාකරණ පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක වීමට අවශ්‍ය මුද්‍රිත පෝරම ඇස්තමේන්තු කිරීම, ලබා ගැනීම හා බෙදා හැරීම නියාමනය කල යුතුය.

5.5 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීමට අදාල අත්පොත්, මාර්ගෝපදේශ, සහ වෙනත් සෞඛ්‍ය අධ්‍යාපන උපකරණ ලබාගැනීම හා බෙදාහැරීම නියාමනය කල යුතුය.

## 6. මානව සම්පත් සංවර්ධනය

6.1 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීමට ක්ෂේත්‍ර හා රෝහල් කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පුහුණු අවශ්‍යතා හඳුනාගෙන වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කල යුතුය. පවුල් සෞඛ්‍ය කාර්යාංශය සහ අදාල වෘත්තීය ආයතන සමග එක්ව පුහුණු වැඩ සටහන් සැලසුම් කර පුහුණු වැඩමුළු පැවැත්විය යුතුය. අදාළ කාර්ය මණ්ඩලයේ සියල්ලන්ම එම පුහුණුව ලබා ගත් බවට තහවුරු කල යුතුවේ.

6.2 පවුල් සෞඛ්‍ය කාර්යාංශයෙන් ලබාදෙන උපදෙස් පරිදි මාතෘ හා ළමා සෞඛ්‍යය පිළිබඳ පුහුණු වැඩ සටහන් සැලසුම් කර පුහුණුවීම් පැවැත්විය යුතුය.

6.3 සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල මාසික රැස්වීම්, ප්‍රාදේශීය රැස්වීම්, සේවස්ථ පුහුණු හා ප්‍රගති සමාලෝචන රැස්වීම් ක්‍රමානුකූලව පැවැත්වෙන බව තහවුරු කල යුතුවේ.

6.4 ක්ෂේත්‍ර මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ උසස්වීම් සඳහා පරීක්ෂණ පැවැත්වීමට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත සහයෝගය ලබාදිය යුතුය.

6.5 කාර්ය මණ්ඩල පුරප්පාඩු හඳුනා ගැනීමටත්, නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් වලදී දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත සහයෝගය ලබාදීමටත්, ඉදිරි කාලයේ ඇතිවිය හැකි කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා යෝජනා ඉදිරිපත් කිරීමටත් කටයුතු කල යුතුය.

7. **වෙනත් කාර්යයන්**

7.1 වැඩිදුර විමර්ශන අවශ්‍ය වන මාතෘ හා ළමා සෞඛ්‍යය ගැටළු හඳුනා ගැනීමටත් ඊට අදාල සමීක්ෂණ සැලසුම්කර ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කල යුතුය.

7.2 හදිසි හා ආපදා අවස්ථාවක දී ප්‍රතිසංවිධානාත්මකව මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සැපයීම තහවුරු කල යුතුය.

7.3 දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයා විසින් පවරන වෙනත් කාර්යයන් ක්‍රියාත්මක කල යුතුය.

1984.04.10 දිනැති පොදු චක්‍රලේඛ අංක 1328 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු වේ.

......................................................
වෛද්‍ය ආර්.ආර්.එම්. එල්. ආර්. සියඹලාගොඩ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / මහජන සෞඛ්‍ය සේවා
සෞඛ්‍ය අමාත්‍යාංශය.

......................................................
වෛද්‍ය පී.ජී.මහිපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය.

## මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකයේ, මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ කාර්යාලය පවත්වාගෙන යාම පිළිබඳ උපදෙස් මාලාව

1. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේ මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකයේ පහත සඳහන් වාර්තා වල තොරතුරු හා ලිපිගොනු පවත්වාගෙන යා යුතුය.

   1. දිස්ත්‍රික් සිතියම - ජනගහණය,<br>සෞ.වෛ.නි. කොට්ඨාශ,<br>රෝහල්<br>අභිකුත් වැදගත් බිම් සළකුණු ලකුණු කර දැක්වීම

   2. ජීව සංඛ්‍යා හා ප්‍රධාන දර්ශක - ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් දැක්විය යුතුය.<br>උදා: 1. උපත් අනුපාතිකය<br>2. පරාජන්ම මරණ අනුපාතය<br>3. ළදරු මරණ අනුපාතය<br>4. මාතෘ මරණ අනුපාතිකය<br>5. උපත් බර අඩු අනුපාතය<br>6. පවුල් සංවිධාන ක්‍රම භාවිතයේ අනුපාතය (නවීන - තාවකාලික, ස්ථිර, ස්වාභාවික / සම්ප්‍රදායික)

   3. දිස්ත්‍රික්කයේ පවත්නා රෝහල්, මාතෘ නිවාස, මධ්‍යම බෙහෙත් ශාලා සහ මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පිළිබඳ විස්තර

   4. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ කළාප අධ්‍යාපන කාර්යාල පිළිබඳ විස්තර

   5. එක් එක් සෞ.වෛ.නි. කොට්ඨාශ අනුව පහත සඳහන් ලිපිගොනු පවත්වාගෙන යා යුතුයි.

      a. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශ, මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ, මහජන සෞඛ්‍ය හෙද සොයුරි කොට්ඨාශ සහ සායන මධ්‍යස්ථාන ඇතුලත් සෞ.වෛ.නි. කොට්ඨාශයේ සිතියම දැක්විය යුතුයි.

      b. ජනගහනය, සෞ.වෛ.නි. කොට්ඨාශ, මහජන සෞඛ්‍ය හෙද සොහොයුරි කොට්ඨාශ මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශ අනුව දැක්විය යුතුයි.

      c. සායන මධ්‍යස්ථාන (ක්ෂේත්‍ර බර කිරීමේ මධ්‍යස්ථානද ඇතුළුව) සායන සහ සායන පැවැත්වෙන දිනයන් පිළිබඳ විස්තර

      d. සේවාස්ථ පුහුණු, මාසික රැස්වීම විශේෂ වැඩසටහන් දින.

      e. දිස්ත්‍රික්කයේ අධීක්ෂණ නිලධාරීන් පිළිබඳ තොරතුරු

      f. අධීක්ෂණ නිලධාරීන්ගේ ඉදිරි කාලසටහන්

      g. අධීක්ෂණ කාර්ය චක්‍රය සහ අධීක්ෂණ වාර්තා

h. අනුමත කාර්ය මණ්ඩලය, සිටින කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු ඇතුලත් කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු.

i.. පාසල්, පෙර පාසල්, ස්වේච්ඡා සංවිධාන, පුද්ගලික වෛද්‍ය ආයතන ළමා නිවාස, වැඩිහිටි නිවාස හා සෞඛ්‍ය සම්බන්ධ අනෙකුත් ආයතන පිළිබඳ විස්තර.

6. පහතු සඳහන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක විශ්ලේෂණය කර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මට්ටමින් පෙර වර්ෂ 2ක් සඳහා වර්ෂිකවත් පවතින වර්ෂයේ කාර්තු සඳහාත් ප්‍රස්ථාර ගත කර ඉදිරිපත් කල යුතුයි.

a) ගර්භනී මව්වරු වේලාසනින් ලියා පදිංචි කිරීම.
b) පසු ප්‍රසව සංරක්ෂණ ආවරණය.
c) පවුල් සංවිධාන ක්‍රම භාවිතයේ අනුපාතය
(නවීන - තාවකාලික, ස්ථිර, ස්වාභාවික / සම්ප්‍රදායික)
c) ත්‍රිත්ව 1/ පංච වන්නත 1/ සරම්ප සහ සරම්ප - රුබෙල්ලා සඳහා ප්‍රතිශක්තිකරණ ආවරණය.
d) උඩු උපත් බර අනුපාතය
e) ළදරු සහ වයස අවුරුදු 1 - 2 අතර ළමුන්ගේ බර අඩු වීමේ ප්‍රතිශතය.
f) පාසල් වෛද්‍ය පරීක්ෂණ කිරීමේ ආවරණය.
g) ගැබ් ගෙල ශ්‍රාව පටල පරීක්ෂණය (පැප් පරීක්ෂණය) කිරීමේ ආවරණය. (ඉලක්ක වයස් කාණ්ඩයේ)
h) පවුල් සංවිධාන නව ප්‍රතිග්‍රාහකයින් ක්‍රම අනුව පසුගිය වසර 5ක ප්‍රගතිය ප්‍රස්ථාරයක් මගින් දැක්විය යුතුය.

7. අධීක්ෂණ කාර්ය චක්‍රය - දිස්ත්‍රික් තාක්ෂණික කණ්ඩායම සඳහා කාර්තු පදනම් කරගත් පොදු අධීක්ෂණ කාර්ය චක්‍රයක්.

8. අධීක්ෂණ වාර්තා ලිපි ගොනුව සහ විශේෂ කාර්ය ලිපි ගොනුව